# පුරාණ ශ්‍රී ලංකාවේ ඉඩම් පරිහරණය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

නාරංගමුවේ සුධම්ම හිමි

## හැඳින්වීම

රාජ්‍යයක් සකස් වීම කෙරෙහි බලපාන ප්‍රධාන අංග හතරෙන් එකක් වන භූමිය පිළිබඳ විවිධ රාජ්‍යයන්හි විවිධ ප්‍රවේශයන් දක්නට ලැබේ. පෙරදිග රාජ්‍යය තුළ භූමිය සම්පූර්ණ වශයෙන් ම රජු සතුය යන මතය පළමු වරට යුරෝපීයයන් විසින් ඉදිරිපත් කරන ලද අතර එය සනාථ කිරීම සඳහා මුස්ලිම් යුගයේ දක්නට ලැබුණු මූලාශ්‍රය පවා උපයෝගී කර ගෙන ඇත. නමුත් පසුකාලීනව පැරණි මූලාශ්‍රය දෙස විචාරාත්මකව බැලීමේ ප්‍රතිඵලයක් ලෙස පූර්ණ ඉන්දීය සමාජය තුළ ඉඩම් අයිතිවාසිකම් පිළිබඳ වෙනස්ම ප්‍රවේශයක් ඇති බව දක්නට ලැබේ. පැරණි ශ්‍රී ලංකාවේ ද භූමිය පිළිබඳව එහි අයිතිවාසිකම් කුමනාකාරයෙන් ක්‍රියාත්මක වූවාද යන්න අධ්‍යයනය කළ යුතු වේ. මෙරට පැවති ඉඩම් භුක්ති ක්‍රමය තුළ රජුගේ භූමිකාව කුමක්ද, රාජ්‍යයේ කාර්ය භාරය කුමක්ද, පෞද්ගලික ඉඩම් හිමියන් දක්නට ලැබෙන්නේද, එලෙස පුද්ගලික ඉඩම් සතු අයිතිවාසිකම් කුමානාකාරයෙන් ක්‍රියාත්මක වීද, ආගමික සමස්ථ සතුව ඉඩම් හිමිකම් පැවතියේ ද යන්න මෙන්ම භූමි අයිතිවාසිකම් සම්බන්ධ නීතිරීති මොනවාද යන්නත් සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය විචාරාත්මකව අධ්‍යයනය කළ යුතු වේ. ඒ අනුව ක්‍රි.පූ තුන්වන සියවසේ සිට ක්‍රි.ව. දොළොස්වන සියවස දක්වා වූ කාල පරාසය තුළ භූමියේ අයිතිවාසිකම් රජු සතු වීද නැතහොත් නිදහස් ඉඩම් භුක්ති ක්‍රමයක් පැවතුනේද යන්න මෙතුළින් අධ්‍යයනයට පාත්‍ර කෙරේ.

මානව ජනාවාසකරණය හා රාජ්‍යත්වය පිළිබඳ ආරම්භක අවධියේ පටන් භූමිය ඉතා වැදගත් සාධකයක් වූ බව දක්නට ලැබේ. අධිපතිත්වය හා ආර්ථික සාධක මත එම තත්ත්වය ඇති වූ බව හඳුනා ගත හැකි වේ. රාජ්‍ය හා රාජ්‍යත්වය පිළිබඳ හමුවන පැරණිතම මූලාශ්‍රයක් ලෙස හමුවන අග්ගඤ්ඤ සූත්‍රයට අනුව හැල්

කෙත් පාලනයට, ආරක්ෂාවට එක් පුද්ගලයෙකු මහජන සම්මතයෙන් පත් කරගත් අතර ඔහු කෙත්වතුවලට ආධිපත්‍ය දැරූ හෙයින් ඛත්තිය (ක්ෂත්‍රිය) ලෙස වහරනු ලැබීය. එමෙන්ම ගැරහිය යුත්තාට ගරහමින් දණ්ඩනයට ලක් කළ යුත්තා දණ්ඩනයට ලක් කරමින් කටයුතු කිරීමට අනෙක් වැසියන් තමාගේ ඇල් සහල් වලින් කොටසක් ලබා දීමට එකඟ වී ඇත.[1] ඒ අනුව ආර්ථික සාධකයක් එනම්, භූමිය මත පදනම්ව එය ආර්ථික කරුණක් සේ පාලනය කිරීම, නඩත්තුව, ආරක්ෂාව පදනම් කර ගනිමින් පාලකයා කටයුතු කළ බව දක්නට ලැබේ. එමෙන්ම පූර්ව ඓතිහාසික යුගයේ ලංකාවේ ජනාවාස පිහිටුවා ගැනීම කෙරෙහි බලපෑ සාධක ලෙස සාරවත් පස, වාරි මාර්ග නිර්මාණය කර ගැනීමේ පහසුව, මෙන්ම ඛනිජ සම්පත් ස්ථාගනත වීම සලකා ඇති බව පර්යේෂණ තුළින් පෙන්වා දී ඇත.[2]

එමෙන්ම පූර්ව රාජ්‍ය අවධිය තුළ මෙරට පාලන බලතල ඇතිව කටයුතු කළ පරුමක, අය, බත, හරත වැනි නිල නාම දැරුවන් ද සාමාන්‍ය ජනතාවට වඩා වැඩි භූමි ප්‍රමාණයක අයිතිවාසිකම් දැරූ බව මුල් බ්‍රාහ්මී ශිලා ලේඛනයන්හි එන පරිත්‍යාග දෙස බැලූ කල දක්නට ලැබේ.[3] එපමණක් නොව රාජ්‍යයක ප්‍රධාන අංග සතරින් එකක් ලෙස භූමිය හඳුන්වා දෙනු ලැබීම තුළ අතිශය වැදගත්කමක් හිමි වූ අයුරු ස්ඵුට වේ. එනිසාම දුරාතීතයේ පටන් භූමිය හා රාජ්‍යත්වය අතර සුවිශේෂී තත්වයක් හඳුනා ගත හැකි වන අතර රජුගේ බලය තහවුරු කිරීම සඳහා භූමිය වැදගත් සාධකයක් වන බැවින් එහි පූර්ණ අයිතිය බලය රජුට පැවරීමට පැරණි භාරතීය න්‍යායාචාර්යවරුන් කටයුතු කර ඇත.

කෙසේ නමුත් කෙත්වතුවලට අධිපති ලෙස විග්‍රහ කළ ද හැල් කොටසක් පමණක් ලබා දීම තුළ භූමියේ සම්පූර්ණ අයිතියක් නොවූ බව ගම්‍ය වේ. මේ අනුව භූමිය සම්බන්ධ අයිතිවාසිකම් ක්‍රමානුකූලව ගොඩනැගුණු ආකාරය දක්නට ලැබේ. මෞර්ය අධිරාජ්‍යයේ භූමි හිමිකම් පිළිබඳව විමසුමක යෙදෙන එෆ්.ඩබ්. තෝමස් පෙන්වා දෙන්නේ රජුගේ ස්වාධීනත්වය හැරෙන්නට බිමේ අවසාන අයිතිය රජුට යටත් වූ අතර එය එලෙසම පැවතුණු බව පෙන්වා දේ. එනම් ආදායම රජුට අයත් වූ බවත් එය නොගෙවා සිටියහොත් ඉඩම රජයට පවරා ගත හැකියාවක් තිබූ බව දක්වයි.[4] මූගල් යුගය තුළ සමින්දාරි

ක්‍රමය, රයට්වාරි ක්‍රමය ආදි වශයෙන් අතිශය සංකීර්ණ වූ වටපිටාවක් තුළ භූමියේ අයිතිවාසිකම පිළිබඳ අධ්‍යයනය කළ ජේම්ස් මිල් වැනි යුරෝපීය උගතුන් තම අධිරාජ්‍ය බලය පිහිටුවා ගැනීම සඳහාත්, බදු ආදායම් ලබා ගැනීමට නෛතිකව ප්‍රවේශ වීම සඳහාත් භූමියේ සියලු හිමිකම් රජු සතු වේ යන මතය ඉදිරිපත් කළ බව පැහැදිලිව දක්නට ලැබේ.[5]

මෙවැනිම ප්‍රවේශයකින් ලංකාවේ පැරණි ඉඩම් භුක්ති ක්‍රමය, භූමි පරිහරණය පිළිබඳ අධ්‍යයනය කළ එච්.ඩබ්. කොඩ්රින්ටන්, විල්හෙල්ම් ගෛගර්, එම්.බී. ආරියපාල, ටිකිරි අභයසිංහ වැනි විද්වතුන් පෙන්වා දෙන්නේ රජු රාජ්‍යයේ සියලු භූමිවල අයිතිකරු බවයි.[6] මෙවැනි මතයක් ඉදිරිපත් කිරීමට හේතු ලෙස සිරිවීර පෙන්වා දෙන්නේ රජු ඇමතු භූපති වැනි අභිධානයන් හා ඉංග්‍රීසින් විසින් ඉදිරිපත් කරන ලද මතයන් හේතු වී ඇති බවයි. නමුත් ලංකාවේ ශිලා ලේඛන සහ සාහිත්‍ය මූලාශ්‍රය විචාරාත්මකව අධ්‍යයනය කිරීමේ දී එම මතයේ සාවද්‍ය බව දැකගත හැකි වේ. එපමණක් නොව පැරණි මූලාශ්‍රයන්හි භූමිය යන්න වෙනුවට 'ගාම' යන පදය හමුවේ. එහිදී ගුණවර්ධන පෙන්වා දෙන්නේ නූතන අර්ථයෙන් නිරූපණය කරන ගම නොව බෙඩින් පවල් ඉන්දීය පරිසරය තුළ ඉදිරිපත් කළ 'එක් තැනකට රාශිභූත වූ ඉඩම් සමූහය. යන්නයි.[7] එමෙන්ම වත්ත යන පදය හමුවන අතර බොහෝ ලිපිවල භූමිය, මනින ඒකකයෙන් නාමකරණය කර ඇත. (දෙපයළ කිරියක් කුඹුර්, සතර අමුණක්) 'ඉඩම්' යන පදය ද්‍රවිඩ බසින් සිංහලයට එකතු වූ බවත් හිස්සැල්ලේ ධම්මරතන හිමියෝ පෙන්වා දෙති.[8] පුරාණ ශ්‍රී ලංකාවේ රජු සතු භූමියේ අයිතිවාසිකම හැදෑරීමේ දී අයිතිය යන පදය නූතන විග්‍රහයන්ටද අනුකූල නොවන බවත් ඊට වඩා සංකීර්ණ ස්වරූපයක් ගන්නා ලද බවත් සිරිවීර පෙන්වා දේ.[9] එබැවින් මෙරට තිබූ භූමිය පරිහරණය කිරීම සම්බන්ධව රජයේ ඒකාධිකාරය හා පෞද්ගලික අයිතිය කෙසේ වීද යන්න අධ්‍යයනය කළ යුතු වේ.

**පෞද්ගලික ඉඩම් පරිහරණය**

මෙරට ශිලා ලේඛන හා සාහිත්‍ය මූලාශ්‍රය සියුම් ලෙස අධ්‍යයනය කිරීමේ දී ජනතාවට ඉඩම් මිලදී ගැනීම, විකිණීම, පරිත්‍යාග

කිරීම සඳහා පූර්ණ අයිතියක් තිබූ බව පැහැදිලි වේ. මේ පිළිබඳව පැරණිතම සාධකය හමුවන කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ලෙන විහාර ලෙන් ලිපියක එම ලෙනද, ගොඩ ඉඩම ද, කුඹුරක්ද මතය නම් පුද්ගලයෙකු විසින් භික්ෂූන්ට ප්‍රදානය කරන ලද බව දැක්වේ.[10] එමෙන්ම අවුකන විහාරයෙන් හමුවන ලිපියක දිනහ නම් වැවද තෘණ භූමිය ද එහි බදු ආදායම් ද ලෙනට පූජා කර ඇත.[11] කොතලකිඹියාවෙන් හමුවන ලිපියක ද වැවක් පූජා කිරීමක් ද සඳහන් වේ.[12]

මෙකල ඉඩම් විකිණීම සහ මිලට ගැනීම පිළිබඳව ද සාධක හමුවන බව දක්නට ලැබේ. එහිදී සාමාන්‍ය පුද්ගලයන් පමණක් නොව රජවරු පවා අවශ්‍යතාවය අනුව ඉඩම් මිලදී ගත් බවට සාධක බහුල ලෙස හමුවේ. සීහලවත්ථුප්පකරණයේ දැක්වෙන ආකාරයට සද්ධාතිස්ස රජ දවස (ක්‍රි.පූ.137 - 119) දුප්පත් ගොවියෙකු කහවණු අටක් ගෙවා වපසරිය අට අමුණක පමණ භූමියක් මිලදී ගත් බව දැක්වේ.[13] ක්‍රි.ව 3 - 4 සියවසට අයත් හිගුරේගල පර්වත ලිපියේ යුධ හමුදා සෙබළුන් පිරිසක් කඳවුරට අයත්ව තිබූ කුඹුරු කිහිපයක් කහවණු අසූව බැගින් විකුණා ඇත.[14] එමෙන්ම දහවන සියවසට අයත් එප්පාවල පුවරු ලිපියේ සාමාන්‍ය පුද්ගලයන් වූ වෙලාත්මේ මිහිඳු නමැත්තා උකුණුහස කොත්තා නම් පුද්ගලයාට විකිණූ ඉඩමක් පිළිබඳව හමුවේ.[15] මැණික්දෙන බුද්ගමු විහාරයට අයත් කුඹුරක් වෙහෙර කැමියන් විසින් විකිණූ බව මැණික්දෙන පුවරු ලිපියේ දැක්වේ.[16] රජවරු පවා ඉඩම් මිලදී ගත් බවට සාක්ෂි හමුවන අතර සුබ රජුගේ (ක්‍රි.ව. 60 - 67) විහාරේගල ලිපියට අනුව කහවණු 500කට වැවක් මිලදීගෙන මහා සංඝයා වහන්සේලාට පූජා කර ඇත.[17]

1 වන උපතිස්ස රජු (ක්‍රි.ව. 365 - 406) තමාගේ ඇමතියෙකු සතු ඉඩමක් ඔහුගෙන් ලබා ගෙන විහාරයකට පූජා කළ බවත් ඒ සඳහා වෙනම ඉඩමක් ඔහුට ලබා දුන් බවත් බසවක්කුලම පර්වත ලිපියේ සඳහන් වේ.[18] එමෙන්ම මහාවංසයේ සඳහන් වන ආකාරයට ධාතුසේන රජු විසින් දෙමළ ආක්‍රමණිකයන් විසින් පැහැරගන්නා ලද ඉඩම් නැවත කුලීන හෙවත් ප්‍රභූ ජනයාට ලබා දුන් බව සඳහන් වීම තුළ සාමාන්‍ය ජනතාවට තිබූ ඉඩම් අයිතිය හැඟවේ.[19] II වන පරාක්‍රමබාහු රජු ද (ක්‍රි.ව 1236- 1270) කාලිංග මාඝ පලවා හැරිය පසු කුලීනයන්ගේ ඉඩම් නැවත ලබා දීම තුළ ජනතාවගේ ඉඩම් අයිතිය

පිළිගත් බව තහවුරු වේ.[20] මෙම රජ සමයටම අයත් බෙන්තර ගලපාත විහාර ලිපියේ රජු විසින් රන් ලබා දී මිලට ගත් ඉඩම් විහාරයට පූජා කළ බව සඳහන් වේ.[21] 1 වන ගජබා රජු තමන් විසින් මිලදී ගත් ඉඩම මිරිසවැටි විහාරයට පූජා කළ බව මහාවංසයේ දැක්වේ.[22]

නාගිරිකන්ද ශිලා ලේඛනයට අනුව කුමාරදාස (ක්‍රි.ව 508- 516) රජු වැව් සහ ඉඩම් රැසක් මිලට ගෙන පූජා කර ඇත.[23] එපමණක් නොව ගඩලාදෙණිය පර්වත ලිපියේ (ක්‍රි.ව 1344) වීරසිංහ පතිරාජ ඇතුළු පිරිසක් විහාරයට පූජා කළ ඉඩම් පිළිබඳව සඳහන් වේ.[24] ඉහත සාධක දෙස බැලීමේ දී රටේ මහජනතාව සතුව භූමිය පිළිබඳ නිරවුල් හිමිකම් පැවති බවත් රජුට එය අභිබවා යාමට නොහැකි වූ බව දක්නට ලැබේ.

**භූමිය පිළිබඳ රජුගේ අයිතිය හා ඉඩම් ප්‍රදානය කිරීම**

ජනතාව සතුව ඉඩම් අයිතිවාසිකම් පැවතිය ද වගා කළ ඉඩම්වලින් බදු අය කිරීමේ අයිතිය රජු සතුව පැවත ඇත. වාරි නිර්මාණ ඉදි කිරීම හා නඩත්තු කිරීම, සුභ සාධක සේවා, ආරක්ෂාව සැපයීම ඇතුළු කටයුතු උදෙසා බදු අය කිරීම සිදු කර ඇත. එය භාරතීය කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රය වැනි න්‍යාය ග්‍රන්ථ අනුව යමින් උපදනා භෝගයෙන් හයෙන් එකක් බදු වශයෙන් ලබා ගත් බව වසභ රජුගේ (ක්‍රි.ව 67 - 111) පෙරුමියන් කුලම පර්වත ලිපියේ එන "සකොටසින් එක කොටස පති" යන ප්‍රකාශයෙන් පැහැදිලි වේ.[25] එමෙන්ම ක්‍රි.ව. දෙවන සියවසට අයත් ලිපියක "කරිහ අමිණිය බක" ලෙස සඳහන් වන අතර මෙහි අර්ථය අප්‍රකට වේ. රණවැල්ල මහතා පෙන්වා දෙන ආකාරයට අමුණු හතරක වපසරියෙන් එක අමුණක් බදු ලෙස ලබා ගැනීමද, එසේත් නැතිනම් මුළු කුඹුරෙන්ම සතරෙන් එක කොටසක් ලබා ගැනීම ද, නැතහොත් මුළු කුඹුරේ අමුණු සතරෙන්ම ලැබෙන මුළු අස්වැන්නේ ප්‍රමාණයෙන් පංගුවක් ද යන්න පැහැදිලි නොවන බව දක්වයි.[26]

V වන කාශ්‍යප (ක්‍රි.ව 914 - 923) රජුට අයත් අනුරාධපුර පුවරු ලිපියේ එන "ඇත් වෙහෙර බද් තුවාක් ගම්බිමින් තුමනට් දුන් දසකැර මුත් වැසර් පැත් පමුණු නොගන්නා ඉසා" යන පාඨයට අනුව දහයෙන් කොටසක් (දස හැර) අය කර ඇත.[27] කෙත්වතු සඳහා අය

කර ගන්නා බද්ද කෙත්වත් අය ලෙසත් හේන් වගා කිරීම පිළිබඳ අය කරගත් බදු "කැති අඩ, කෙටු කනබ අය, සෙහෙන් කටුසර අය" ලෙසත් ගෙවතු වලින් අය කළ බද්ද "ඉරය" ලෙසත් හඳුන්වා ඇත. රජවරුන්ගේ ඉඩම් බදු ප්‍රතිපත්තියේ තිබූ සාධාරණ ස්වභාවයන් නිශ්ශංකමල්ල රජුගේ වාදුරුප්ප ශිලාලේඛනයේ දක් වේ. සාරවත් ඉඩම්වලින් ලබා ගන්නා බද්ද අමුණක් හා තුන් පැලක් නොඉක්ම විය යුතු බවත් මධ්‍යස්ථ ඉඩම්වලින් පැල දෙකක ප්‍රමාණයක් ද ආදි වශයෙන් යම්කිසි සීමාවක් දක්වා ඇති බව දක්නට ලැබේ. මෙලෙස බදු අය කරන්නට ඇත්තේ කුඹුරුවලින් බව සිරිවීර මහතා පෙන්වා දෙයි. එමෙන්ම පූජාවලියේ සඳහන් වන්නේ අඳ ක්‍රමයට වගා කළ ඉඩමක් නම් ගොවියාට තුනෙන් එක කොටසක් හිමි වී ඇත. ගලපාත විහාර ලේඛනයේ සඳහන් වන කොලවෙල් අය යනු පොල්, පුවක් වතුවලින් අය කරන ලද බද්දක් බව පරණවිතාන මහතා හඳුනා ගැනීමට උත්සාහ දරයි.[28] එමෙන්ම මිහින්තලේ පුවරු ලිපිය හා දළදාගේ පුවරු ලිපිවලට අනුව වතුවලින් බදු අය කළ බව හැඟවෙන බව කොඩ්රින්ටන් පෙන්වා දෙයි.[29]

රටේ පවතින ඉඩම් සම්බන්ධව රජුට පවතින තවත් බලතලයක් වන්නේ එළි නොකරන ලද කැලෑ ඉඩම් හා භාවිත නොකරන ලද ඉඩම් රජු සතු වීමයි. නමුත් මෙහිදී ඉඩම අයත් වන්නේ පුද්ගලයාට නොව රාජ්‍යත්වය නමැති තනතුරට වීම සුවිශේෂී සිද්ධියකි. මෙවැනි ඉඩම් අළුත් ජනපද පිහිටුවීම, අවශ්‍යතාව මත ප්‍රදානය කිරීම, අළුතින් වගා කිරීම සඳහා ලබා දීම ආදිය සඳහා යොදවන්නට ඇත.[30] එපමණක් නොව අස්වාමික ඉඩම් රජු සතුය යන න්‍යායක් ද ක්‍රියාත්මක විය. හිමිකම් කීමට කිසිවෙකු නොමැති නම් එම ඉඩම් රජුට අයත් වීම මෙහි ස්වභාවයයි. පදිංචි වී සිට අත්හැර දමන ලද ඉඩම් හා ගොඩනැඟිලි සංකීර්ණ ද මේ යටතට අයත් වී ඇත. ක්‍රි.ව 15 වන ශතවර්ෂයට අයත් සේනාසම්මත වික්‍රමබාහු රජුට අයත් ගඩලාදෙණිය ශිලා ලේඛනයට අනුව සටනක දී හෝ ඇතුන් දඩයම් කිරීමේ දී කිසිවෙකු මිය ගියහොත් මියගිය පුද්ගලයාගේ දේපල සම්බන්ධව උරුමකරුවන් නොමැති නම් එම ඉඩම් විහාරයට පැවරිය යුතු බව සඳහන් වේ.[31]

අධිකරණයක දී හෝ රජු විසින් පනවන ලද ආඥාවක් මඟින් ඉඩම්, දේපල ආදිය රාජසන්තක කිරීමේ බලය ද රජු සතු

වේ. ධාතුසේන රජු එම ද්‍රවිඩයන් පරදා රාජ්‍ය බලය තහවුරු කරගත් පසු එම ද්‍රවිඩ රජුන්ට අනුග්‍රහ දක්වන ලද සිංහල ප්‍රභූන්ගේ ඉඩම් රාජසන්තක කළ බව මහාවංසය දක්වයි.[32] V වන කාශ්‍යප රජුට (ක්‍රි.ව 914 - 923) අයත් අනුරාධපුර පුවරු ලිපියක භික්ෂූන් වෙත පවරා ඇති ඉඩම ඔවුන් රජුට එරෙහි වුවද රාජසන්තක නොකළ යුතු බව දක්වා ඇත.[33] VI වන බුවනෙකබාහු (ක්‍රි.ව 1470 - 1478) රජුද එවකට රාජ විරෝධි කුමන්ත්‍රණයක් ලෙස ක්‍රියාත්මක වූ සිංහල සංගේ නම් කැරැල්ලට සම්බන්ධ වූවන්ගේ දේපල රාජසන්තක නොකළ යුතු බව දැදිගම පුවරු ලිපියේ දක්වා ඇත.[34] ඒ අනුව ඉඩම් දේපල රාජසන්තක කිරීම සම්බන්ධව රාජ්‍යත්වය සතු අයිතිය පැහැදිලි වේ.

රජ යන තනතුර නොව රජුට පුද්ගලිකව අයිති ඉඩම් පිළිබඳව මූලාශ්‍ර මඟින් හඳුනාගත හැකි වේ. කුටකණ්ණතිස්ස (ක්‍රි.පූ 44 - 22) රජුගේ පවුල සතු (කුල සන්තක) ඉඩමක් පිළිබඳව මහාවංසයේ දක්නට ලැබේ.[35] එමෙන්ම I වන පරාක්‍රමබාහු රජුද තම මාළිගය ආසන්නයේ පෞද්ගලික උයනක් කර වූ බවද දැක්වේ.[36] එබැවින් පුරාණ ශ්‍රී ලංකාවේ ඉඩම් අයිතිවාසිකම් පිළිබඳව පූර්ණ නිදහසක් තිබූ බව මින් පැහැදිලි වේ.

ඉඩම් ප්‍රදානය කිරීම ද රාජ්‍යත්වය සතු වගකීමකි. විහාරාරාමවල නඩත්තුවට සහ රජුට, රජයට සේවාවක් සපයන ලද විශේෂ පුද්ගලයන් උදෙසා මෙලෙස ඉඩම් ප්‍රදානය කළ බව දක්නට ලැබේ. II වන ගජබාහු රජුට අයත් (ක්‍රි.ව 1136- 1157) කපුරුවැඩුඔය ටැම් ලිපියේ එන සඳහනකින් පැහැදිලි වන්නේ රජයේ නිලධාරින්ට ඉඩකඩම් ආදිය පැවරීම රාජ සභාවක සිදු කරන ලද වැදගත් කාර්යයක් බවයි.[37]

මෙලෙස කරනු ලබන ප්‍රදානයන්හි ස්වභාවය අනුව ප්‍රධාන කොටස් 03කට වර්ග කර දැක්විය හැකි වේ. පළමු ක්‍රමවේදය වන්නේ රජු සතුව හෝ අලුතින් වගා කරන ලද ඉඩමක් සියලු අයිතින් සහිතව පවරා දීමයි. ඇතැම් අවස්ථාවල බදුවලින් පවා නිදහස් කර දී ඇති අතර විහාරාරාමවලට ඉඩම් පැවරීමේ දී මෙම ක්‍රමවේදය භාවිත කර ඇත. දෙවැනි ක්‍රමය වූයේ ඉඩම්වලින් රජුට හෝ රාජ්‍යයට හිමි විය යුතු බදු මුදල පුද්ගලයාට හෝ ආයතනයට ප්‍රදානය කිරීමයි. එලෙස ගම්වර ප්‍රදානයේ දී ඒවායේ පදිංචිව සිටි පුද්ගලයන්ගේ අයිතියට

බාධාවක් නොවූ අතර එම පුද්ගලයන් රජයට වෙනුවට ප්‍රදානලාභියාට බදු මුදල ගෙවිය යුතු වේ. තෙවැනි ක්‍රමවේදය වන්නේ ප්‍රදානය කළ ඉඩමේ ආදායම පමණක් හිමි වීමට සැලැස්වීමයි. එතුළ අයිතිය රජු සතුව පැවතුණි. නමුත් ඉඩමේ ආදායම හා බද්ද අතර වෙනස වටහා ගැනීම තරමක් දුෂ්කර වේ. මෙවැනි ප්‍රදානයන් විවිධ සේවාවක් ඉටු කරන පුද්ගලයන් වෙතට එම සේවාව ඉටු කරන කාලසීමාවට පමණක් අයත් වන ලෙස ප්‍රදානය කර ඇති වග පැහැදිලි වේ.[38]

මෙලෙස ඉඩම් ප්‍රදානය කිරීමේ දී රාජ සභාවේ දී රාජ ආඥාවක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර තල්පතක ලියූ සන්නසක් අදාළ පුද්ගලයාට ප්‍රදානය කරන්නට ඇත. 1 වන විජයබාහු රජු (1070 - 1110) නිතුක් කළ සිත්නරුබිම් බුදල්නාවන්ට කළ ප්‍රදානයන් ලියා ඇත්තේ තඹ පත්‍රයකිනි. එමෙන්ම මහා සම්මත චාරිතානුකූලව අතපැන් වත් කර ඉඩම් ප්‍රදානය සිදු කර ඇත. දේවානම්පියතිස්ස රජු මහාවිහාර සීමා සලකුණු කර මිහිඳු මහරහතන් වහන්සේට අතපැන් වත් කර පූජා කළ බව මහාවංශයේ සඳහන් වේ. එමෙන්ම මෙලෙස ප්‍රදානය කරන ලද ඉඩම්වල ඉතා පැහැදිලි ලෙස ප්‍රමාණයන් පමණක් නොව දිශානුගත සීමා මායිම් පවා දක්වා ඇති අයුරු ශිලා ලේඛන තුළින් හෙළි වේ.

“උතුර් මෙගිරිවත්ත හිම් කොට් දකුණ් දෙසෙන් මි ගස හිම් කොට් ඉසා, පැළැ දෙසෙන් ගැල් මග හිම් කොට් ඉසා පැදුම් දෙසෙන් සං බඩ බැද්ද හිම් කොට් ඉසා මෙ සතර් සීමායෙන්”

අනුරාධපුර කිරිබත් වෙහෙර ටැම් ලිපියේ ඉහත සීමා දක්වෙන අතර වැගුණ මහාරාද නම් බමුණෙකු විසින් ථූපාරාම බෙහෙත් ශාලාවට පරිත්‍යාග කරන ලද ඉඩමේ උතුරු දෙසින් මේගිරි නම් වත්තක් ද නැගෙනහිර දිශාවෙන් වෙහෙර වත්ත ද දකුණින් මී ගසක් ද, බස්නාහිර දිශාවෙන් සංබඩ බැද්ද නම් ඉඩමක්ද බව පැහැදිලිව දක්වා ඇත.[39] මෙලෙස රජුගේ ආඥාව පරිදි ඉඩමේ සතර සිමා සලකුණු කර ප්‍රදානය කිරීම සඳහා එම ස්ථානයට ගමන් කරන සුවිශේෂී නිලධාරීන් පිළිබඳව ටැම් ලිපිවල දක් වේ. ප්‍රධාන වශයෙන් කියැවෙන මෙයිකාප්පර් යන්න දෙමළින් බිඳී ආවකැයි සැලකෙන අතර මෙයි ශරීරය ලෙසත් කාප්පර් යන්න ආරක්ෂක ලෙසත් හඳුනා ගනිමින්

මෙයිකාප්පර් යන්න අංගාරක්‍ෂක ලෙස අර්ථ විවරණය කර ඇත. මහලේ යනු ලේඛන භාරව කටයුතු කළ ලේකම්වරයායය. අරක්සමණා යනු ආරක්‍ෂක ස්වාමි හෙවත් ආරක්‍ෂක අංශ ප්‍රධානියෙකු විය හැකිය. කුඩසලා යන්න නිශ්චිතව කිව නොහැකි වූවත් රාජ මාළිගාව, රාජ භාණ්ඩාගාරය සහ උසස් නිලධාරීන් හට සේවය කළ සුළු නිලධාරීන් පිරිසක් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව රාජකීය ආඥාවක් පිහිටුවීම සඳහා එසේත් නොමැති නම් මධ්‍යම රජයේ අනුමැතිය ලත් කාර්යයන් ඉටු කිරීම සඳහා අත්‍යවශ්‍යම නිලධාරීන් ලෙස මොවුන් කටයුතු කර ඇත. ඒ අනුව රජු විසින් ඉඩම් පැවරීම අතිශය නීත්‍යානුකූල සුවිශේෂී කටයුත්තක් බව දක්නට ලැබේ. මෙලෙස විහාරාරාමයන්ට පවරන ලද ඉඩම් පිළිබඳ ශිලාලේඛනයන්හි බහුල ලෙස හමුවන අතර විවිධ පුද්ගලයන් කළ ප්‍රදානයන් ද දක්නට ලැබේ. කාවන්තිස්ස රජු හා දුටුගැමුණු රජු යුද්ධ සේනාවේ දක්‍ෂතා දක්වන ලද දසමහා යෝධයන් වෙත ගම්බිම් ප්‍රදානය කළ බව සහස්සවත්ථුප්පකරණයේ හා රසවාහිනියේ සඳහන් වේ.

සද්ධාතිස්ස රජු විවිධ පුද්ගලයන්ට පැවරූ ගම්බිම් පිළිබඳව සීහලවත්ථුප්පකරණයේ සඳහන් වේ.

IV වන උදය රජුගේ (ක්‍රි.ව 954- 956) බදුලු ටැම් ලිපියට අනුව හෝපිටිගමුව වෙළෙඳ ගමේ භුක්තිය තමාගේ සෙනවියෙකුට පැවරූ බව සඳහන් වේ.[40] දසවන සියවසට අයත් කොණ්ඩවටවන ටැම්ලිපියේ මෙතෙර දිගාමඩුල්ලෙහි ඇරැගම නම් ගම සෙනවියෙකුට පැවරූ බව දැක්වේ.[41] II වන ගජබාහු රජු මූර්ති ශිල්පියෙකුට ඉඩම් ලබා දුන් බවත් එම රජුගේම මාණිකනෙයි දෙමළ ලිපියෙහි තොරතුරු ලැබේ.[42] I වන පරාක්‍රමබාහු රජු බුරුම ආක්‍රමණය මෙහෙයවා ජය ගන්නා ලද කිත්නුවරගල් සෙනවියාට දුන් ගම්වර දෙවනගල ශිලාලිපියේ ද නිශ්ශංකමල්ල රජු තම මාළිගය කරවූ ලොලුපැළැකුළු ලෝකෙනාවන්ට දුන් ගම්වර පිළිබඳ කටුගහගල්ගේ ලිපියේ ද සඳහන් වේ.[43] කොට්ටන්ගේ ගිරිලිපියට අනුව රජු තමන් සිංහාසනයේ තැබූ ලෝකේ අරක්මේනාවන්ට කළ ප්‍රදානයන්ද සඳහන් වේ.[44]

IV වන දප්පුල රජු පුණල්නා නම් වෛද්‍යවරයාට කළ ඉඩම් ප්‍රදානයන් පිළිබඳව දොරබාවිල ටැම් ලිපියේ සඳහන් වේ.[45] ඒ අනුව

බෙහෙත් ශාලාවලට පවා ඉඩම් ප්‍රදානය කර ඇති අතර ඇතැම් අවස්ථාවල සුවිශේෂී කාර්යයන් සඳහා ද එනම් රෝහල්වලට බෙහෙත් සැපයීම, ආගමික ගොඩනැඟිලි අළුත්වැඩියාව වැනි කටයුතු සඳහා ද ඉඩම් ප්‍රදානය කළ බව දක්නට ලැබේ.

**ඉඩම් වර්ග සහ රජුගේ හෝ රාජ්‍යයේ බලාධිකාරිය**

පුරාණ ශ්‍රී ලංකාවේ ඉඩම පිළිබඳ රජුගේ අයිතිවාසිකම් කුමන පසුතලයක ක්‍රියාත්මක වූයේ ද යන්න අධ්‍යයනය කිරීමේ දී පැවති ඉඩම් වර්ග හමුවේද වෙනස් වී ඇති ආකාරය දක්නට ලැබේ. එවැනි ඉඩම් වර්ග කීපයක් හඳුනාගත හැකි වේ.

**පමුණු ඉඩම්**

පමුණු නැතහොත් පරවේණි ලෙස හඳුන්වනු ලබන්නේ පාරම්පරික ලෙස අඛණ්ඩව භුක්ති විඳිමින් රැගෙන ආ ඉඩම් යන්නයි.[46] මෙවැනි පරම්පරානුගතව භුක්ති විඳින ලද ඉඩම් පැවති බවට සාධකයක් අනුරාධපුර මුල් අවධියකට දක්නට ලැබේ. වසභ (ක්‍රි.ව 67 - 111) රජුට අයත් පෙරුමියන්කුලම ගිරිලිපියේ "තුමහ කුල සතක කොටස තුමහ පිත සතක කොටස" යන යෙදුම් තුළින් වැව්වල කොටස් වුවද කුල හෙවත් පරපුරෙන් පරපුරට භුක්ති විඳි දේපල පිළිබඳව සාක්ෂි සපයයි. මෙම පමුණු ඉඩම් පවරා දීමේ දී කෙතරම් දීර්ඝ කාලයක් පැවතීම අපේක්ෂා කළේද යත් ''හිර් සන්ද'' පවත්නා තෙක් හෙවත් හිරු සඳු පවතිනා තෙක් අපේක්ෂා කළ බව දක්නට ලැබේ. ඒ අනුව පමුණු ලබන්නා මිය ගිය ද දරු මුණුපුරන්ට අයත් බව IVවන කාශ්‍යප රජුගේ අනුරාධපුර පෙරියසේන වත්ත ටැම්ලිපියේ එන ''බුද් මහලුන්ගේ පෙර පරම්පරාවෙන් නො තොරා" යන පාඨයෙන් ධ්වනිත වේ.[47] එමෙන්ම IV වන උදය රජුගේ ඇත්දත්කඩවල ටැම් ලිපියේ ''සැකෑ බුදල්නාවන් කුමන් ඉසා මෙකුන් දරු මුණුපුරන් ඉතා පරපුරින් නොතොරා වළඳනු කොට්'' යන්නෙන් තවදුරටත් පැහැදිලි වේ.[48] මෙම නීතිය කෝට්ටේ යුගය දක්වාම පැවති බව ඕරුවල සන්නයෙහි ''මේ කියන අවුහළ ඔජ්ඣලු පුරෝහිතයන්ගේ දරු මුණුබුරු පරම්පරාවට ආ චන්ද්‍රාර්ක ස්ථායීව පවතනා පණතටත් '' යන පාඨයෙන් හෙළි වේ.[49]

එපමණක් නොව පමුණු ලෙස ලබා දුන් දේපල රාජ උදහසට පත්ව නැවත පවරා ගැනීමට ද රජුට අවසර නොතිබූ බව IV වන

කාශ්‍යප රජුට අයත් පොළොන්නරු රජ මාළිග ටැම්ලිපියේ එන ''මෙ පමුණු රද් උදහසිනුද් රදොල් කොට් නොගන්නා ඉසා'' යනු පාඨයෙන් තහවුරු වේ.[50] නමුත් තවද පමුණු ලද්දායේ දරු මුණුපුරන් වැරදි කළ ද අවවාද කිරීම තෙවරක් සමාව දීම මිස දඩ ගැසීම හෝ පමුණු ලබා ගැනීම නොකළ යුතු බව I වන විජයබාහු රජුගේ පණාකඩුව තඹ සන්නසෙන් හෙළි වේ.[51]

මෙම පමුණු ඉඩම් සඳහා ඇතැම් අවස්ථාවල කුල ගාම, කුල සන්තක ගාම යන පද ද යොදා ඇත. මහාවංසයේ දැක්වෙන ආකාරයට මාඝ විසින් සිංහල ප්‍රභූන් සතු කුල ග්‍රාම හෙවත් ප්‍රවේණි ගාම උදුරා ගත් බව සඳහන් වේ. II වන පරාක්‍රමබාහු රජු තම අමාත්‍ය දේව පතිරාජ ඇමතිවරයාට දෙල්ගස්ගම ආදි ගම් කුල සන්තක කර පවරා දුන් බව සඳහන් වේ.[52] මෙලෙස ලබා දෙන්නා වූ පමුණු ඉඩම් නැවත කිසිදු රජෙකුට කිසිදු අවස්ථාවක පවරා ගත නොහැකි පරිදි හිරු සඳු පවත්නා තෙක් ලබා දෙන බවට සහතික කිරීමකි. ලීලාවතී රැජිනගේ (ක්‍රි.ව.1200 - 1202) පුළියන්කුලම පුවරු ලිපියට අනුව එම දාන ශාලාවක හිරු සඳු පවත්නා තෙක් ඉඩම් ප්‍රදානය කර ඇත.[53] V වන පරාක්‍රමබාහු (1341 - 1357) රජුගේ අලවල අමුණ පර්වත ලිපියේ මේ බව සවිස්තරාත්මකව දක්වා ඇත.[54] මෙම සිරිත කෝට්ටේ යුගය දක්වාම පැවති බව VI වන විජයබාහු රජුට අයත් වේරගම සන්නසෙහි එන ප්‍රකාශය සාක්ෂි දරයි.[55] එමෙන්ම අනුරාධපුර ආදි මුල් යුගවල හමු වූ මෙයිකාප්පර් වැනි නිලධාරීන් මේ සමය වන විට සන්හස් තිරුවරහන්, සන්හස් තිරුවරගන් ලෙස හඳුන්වා ඇති බව දක්නට ලැබේ.

පමුණු ප්‍රදානය කිරීමේ දී හිර සඳ හිමි පමුණු යන පදයට පර්යාය පදයක් ලෙස ''බඹදෙයින් දීම'' යන පදය හමුවේ. බ්‍රහ්ම දේය යනු ශ්‍රේෂ්ඨ දීමනාව හෙවත් නැවත නොගන්නා සම්පූර්ණයෙන් අත්හල පරිත්‍යාගය යන්නයි.[56] V වන කාශ්‍යප රජුගේ මයිලගස්තොට ටැම්ලිපියේ මිහිඳු ඇපාණන් කපුගම් පිරිවෙනට ඉඩම් ප්‍රදානය කර ඇත්තේ බඹ දේය වශයෙනි.[57] මාතලේ දිස්ත්‍රික්කයේ මැද උල්පොත ලිපියේ ද මෙවැනිම දෙයක් දක්නට ලැබේ. සද්ධර්මාලංකාරයේ එන කථා පුවතකට අනුව සද්ධාතිස්ස රජු තිස්ස නම් අමාත්‍යවරයාට අත්තරංග නම් ස්ථානයෙන් බඹදෙයට පවරා දුන් බව සඳහන් වේ.[58]

එමෙන්ම මෙම ග්‍රන්ථයට අනුව බඹදෙය යනු අතීතයේ බමුණන්ට දුන් පමුණු ඉඩම් යන්න පැහැදිලි වේ. පසුකාලීනව බමුණන්ට දුන් ඉඩම් චතුර්වේද මංගලම් ලෙස හැඳින් වූ බව I වන විජයබාහු ( ක්‍රි.ව.1054 - 1114) රජුගේ පාලමොට්ටෙයි දෙමළ ශිලාලේඛනයෙන් හෙළි වේ.[59]

මීට අමතරව "හෙටි හසින් පමුණු කොට" යන පදය ද හමු වේ. හෙටිහස යනු රාජ මුද්‍රාව බවත් තම රාජකීය මුද්‍රාව සන්නසක ඔබා පමුණු දීමේ සිරිතක් පැවති බවට රණවැල්ල මහතා අදහස් කරයි.[60] ඉහත විමසුම අනුව පමුණු ප්‍රදානය කිරීමෙන් පසුව රජුට හෝ රාජ්‍යට ඒ පිළිබඳ කිසිදු අයිතිවාසිකමක් නොවූ අතර බදු එකතු කිරීමක් නොවුනි. නමුත් ඇතැම් අවස්ථාවල විහාරාරාමවලට යම් යම් ප්‍රදාන කරන ලෙස රජු විසින් නියම කර ඇති වග දක්නට ලැබේ. IV වන දප්පුල රජුට අයත් ගොන්නෑව දේවාල ටැම් ලිපියට අනුව අග්බෝ මුගයින් ලැබූ ඉඩම වෙනුවෙන් මහා විහාරයට ධාන්‍ය අමුණක් ලබා දීමට නියම කර ඇත.[61] එමෙන්ම කුරුණෑගල යුගයේ ලියැවුණු දළදා සිරිතට අනුව IV වන පරාක්‍රමබාහු රජු විසින් ''ලක්දිව පමුණු ඇත්තවුන් දළදාගෙට පඬුරු දිය යුතුය.'' යනුවෙන් නියම කර ඇත.[62]

රජවරුන් විසින් මෙලෙස ලබා දුන් පමුණු ඉඩම් ක්‍රමය මහනුවර යුගයේ දී නින්දගම් ලෙස හඳුන්වන ලදි. නමුත් අනුරාධපුර යුගයේ දී ද මෙම පදය හමුවනු දක්නට ලැබේ. IV වන දප්පුල රජුට (924 - 935) අයත් මුල්ලේගම ටැම්ලිපියේ ''මහා සංඝයා කෙරෙහි ප්‍රසාදයෙන් වුසුරුගමට් නින්ද් කොට් බහාලු'' යන පාඨයෙන් දක්නට ලැබෙයි.[63] නිශ්ශංකමල්ල රජුද විජය යාන්තැන්නාවන්ට ඉඩම් පවරා ''මෙම නින්ද'' යන යෙදුම යොදා තිබීම තුළ පමුණු යන්නට පර්යාය පදයක් ලෙස යෙදූ බව දක්නට ලැබේ.[64] තවද ගම්වර ලබා දීම යන පදය ද භාවිත කර ඇති අයුරු දක්නට ලැබේ. සහස්සමල්ල රජුගේ ලිපියක ''පමුණු කොට ගම්වරක් දී වදාළ'' යන්නෙන් ඒ බව පැහැදිලි වේ.[65]

**දිවෙල් ඉඩම්**

පැරණි ශ්‍රී ලාංකීය ආර්ථිකය තුළ මුදල් සංචරණ ක්‍රම පැවතිය ද රජයේ නිලධාරින් උදෙසා වේතන ලෙස ඉඩම් ලබා දීම සිදු කර ඇත. මෙම ක්‍රමවේදය ක්‍රි.පූ. යුගයේ පටන් පැවතුන ද සාක්ෂි විරල වන

අතර නව වන ශත වර්ෂයෙන් පසුව හමුවන ලේඛනයන්හි දක්නට ලැබේ. රාජ්‍යයට සේවාව සපයන කාලය තුළ දී පමණක් භුක්ති විඳීමට හැකිවන අයුරින් මෙම ඉඩම් ප්‍රදානය කරන අතර සේවා කාලය අවසන් වූ පසු රජයට නැවත ලබා දීය යුතු වේ. එබැවින් දිවෙල් ඉඩම්වල අයිතිය රාජ්‍ය සතු බව අවබෝධ කර ගත හැකි වේ.[66]

15 වැනි ශත වර්ෂයට අයත් ඔරුවල සන්නසෙහි ''සේවා දිවෙලට දුන් බතගම ඔරුවල'' ලෙස සඳහන් වීම තුළ ඒ බව තහවුරු වේ.[67] ඇතැම් අවස්ථාවල සේවාව පමණක් නොව භාණ්ඩ සැපයීම උදෙසා ද දිවෙල් ඉඩම් ප්‍රදානය කර ඇත. II වන ගජබාහු ( ක්‍රි.ව.1132-1153) කාලයට අයත් හිගුරක්ගොඩ දෙමළ ලිපියේ අගම්පඩි හමුදාවේ දෝලා රැගෙන යන අයෙකුට ඒ වෙනුවෙන් දිවෙල් ලබා දී තිබූ බව හෙළි වේ.[68] දිවෙල් ලෙස ලබා ගන්නා ඉඩම් තනතුර දරණ කාලය තුළ වගා කරගත හැකි වේ. එමෙන්ම සාමාන්‍ය ජනතාව සතු ඉඩම් ඇතුළු ගම්බිම් දිවෙල් ලෙස ප්‍රදානය කරන අතර එහිදී සිදුවන්නේ එම ප්‍රදානය කරන කොටසේ රජයට ලබා දෙන බදු මුදල් දිවෙල් ලද්දාට ලබා දීමයි. එමෙන්ම නිලධාරියාගේ තරාතිරම අනුව ලැබෙන දිවෙල් ප්‍රමාණය වෙනස් වී ඇත. දිවෙල් ලබා දීමේ ස්වරූපය තුළ දිවෙල් ලද්දා නැවත රජයට බදු ගෙවිය යුතු වන්නේ නොවේ. දිවෙල් ලද්දාගේ අනුප්‍රාප්තිකයන් එම තනතුර දරණු ලැබුවහොත් පමණක් එම ඉඩම් ලැබෙන අතර නැත්නම් රජයට නැවත දිය යුතු වේ. මෙම දිවෙල් ඉඩම් පිළිබඳව නියමාකාර ලෙස ලේඛන පවත්වාගෙන ගිය බවට වංශකථාවල එන "ජීවිත පොත්ථක'' යන පදයෙනුත් ශිලා ලේඛනයක එන ''දිවෙල් පොත් කරන'' යන පදයෙනුත් ධ්වනිත වන බව සිරවීර පෙන්වා දෙයි.[69]

**භෝග ගාම**

පැරණි සාහිත්‍ය මූලාශ්‍ර තුළ දක්නට ලැබෙන ''භෝග ගාම'' යන පදය ද බහුලව දක්නට ලැබේ. මේ පිළිබඳව උගතුන් බොහෝ අර්ථ දක්වා ඇති අයුරු දක්නට ලැබේ. ඉන්දීය ශිලා ලේඛනයන්හි රාජකීය අය බදු යන අර්ථයෙන් ද පාලි ශබ්ද කෝෂයෙහි අය ගාමය, කප්පම් ගමක්, ගමේ භූමිය අයිතිකරුට කප්පමක් හෝ කිසියම් ප්‍රමාණයක් ගෙවිය යුතු ගමක් ලෙසත් දක්වා ඇත. එමෙන්ම 'ධනය'

හෝ රාජ්‍ය ආදායම්' යන අර්ථය ද ලබා දිය හැකි බව දැක්වේ. කෙසේ නමුත් භෝග ගාම යනු සෑම අවස්ථාවකම පුද්ගලයන් නඩත්තු කිරීම සඳහාම ලබා දුන් ඉඩම් හෝ දේපල බව ගුණවර්ධන පෙන්වා දේ.[70] විශේෂත්වය වන්නේ වෙහෙර විහාර, භික්ෂූන් මෙන්ම ගිහියන් සඳහා ද ප්‍රදානය කර තිබීමයි. දුටුගැමුණු රාජ්‍ය සමයේදී (ක්‍රි.පූ 161 - 137) එළාර මහා සංග්‍රාමයෙන් පසු නන්දිමිත්‍ර යෝධයා හට දදුරු ඔය අවට කලාපය භෝගගාම කොට පාලන කටයුතු පැවරූ බව සඳහන් වේ. මෙහිදී සහස්සවත්ථුප්පකරණයේ දක්වෙනුයේ "ජජ්ජර නදිතො පට්ඨාය පරතීරං භෝග ගාමං" යනුවෙනි.[71] එනම් දදුරු ඔය පටන් එතෙර වූ ගම් පිළිබඳවය. මෙම ග්‍රන්ථය ලියවෙනුයේ අනුරාධපුර නගර පසුබිමකය. දුටුගැමුණු රජු පැවරීම සිදු කරන්නේද අනුරාධපුර සිටය. එබැවින් දදුරු ඔය පටන් එතෙර භෝගගාම ලෙස අදහස් කරන්නේ දදුරු ඔය දකුණු ඉවුරේ සිට කලාපයයි. එනම් මෙම කලාපය දදුරු ඔය සිට කළු ගඟ දක්වා වූ මායා රටේ දකුණු කොටස බව සිරිමල් රණවැල්ල දක්වා ඇත.[72]

### විහාර ඉඩම් ක්‍රමවේදය හා රාජ්‍ය මැදිහත් වීම

මිහිඳු මාහිමියගේ මෙහෙයවීමෙන් දේවානම්පියතිස්ස රජ දවස මෙරට බුද්ධ ශාසනය ස්ථාපිත කරන ලද අතර ශ්‍රද්ධාවන්ත රජදරුවන්ගේ දායකත්වය මධ්‍යයේ එකී සංඝ සමාජය ප්‍රමාණයෙන් ආයතනික වශයෙන් මෙන්ම භෞතික සම්පත් අතින්ද වර්ධනය පසු දක්නට ලැබේ. ඉපැයීමකින් තොර වූ බෞද්ධ සංඝ සමාජයේ මෙන්ම සංස්කෘතික නිර්මිත පරිසරයේත් ආරක්ෂාව, නඩත්තුව, පෝෂණය පාලකයන්ගේ පරම වගකීමක් ලෙස සැලකූ බැවින් භික්ෂූන් වහන්සේලාගේත්, වෙහෙර විහාර නඩත්තුව උදෙසාත් ආර්ථික මූලයන් ලෙස ඉඩම්, ගම්බිම් ප්‍රදානය කිරීම. ක්‍රි.පූ දෙවන සියවසේ සිට දක්නට ලැබේ. මෙම තත්ත්වය කෙතරම් සංකීර්ණ ක්‍රියාවලියක් වීද යත් පණවන ලද අණපනත් තුළින් විශද වේ. මේ පිළිබඳ පළමු සාධකය හමුවන්නේ ලජ්ජිතිස්ස (ක්‍රි.පූ 119- 109) රජුගේ දූවේගල සහ නාඋල්පත ලිපිවල සඳහන් වන ඉඩම් පූජාවන් ය.[73] අභිලේඛන හා වංශ කථා තුළින් පසුව සියලු ආයතන සඳහා වරින් වර කරන ලද ප්‍රදාන හඳුනාගත හැකි වේ.

විහාර සඳහා ඉඩම් ප්‍රදානය කිරීමේ දී ද උක්ත දක්වන ලද ක්‍රමයන්ට යටත්ව ප්‍රදානය කළ ආකාරය දක්නට ලැබේ. එහිදී විහාරයට ඉඩම් පූජා කළ පසු රාජ්‍ය අය බදු විහාරයටම අයත් වූ අතර පූජා කරන ලද ඉඩමේ වැසියන් රජයට ගෙවිය යුතු වූ බදු විහාරයට ගෙවිය යුතු විය. එසේත් නොමැති නම් පූජා කරන ලද ඉඩමෙන් අය විය යුතු කොටස ලබා නොගැනීම තවත් ක්‍රමයක් විය. එමෙන්ම මෙලෙස ලැබුණු ඉඩම් වගා කිරීම සහ විහාරයේ සේවකයන් උදෙසා වැටුප් ලෙස ලබා දුන් බව මිහින්තලේ පුවරු ලිපිය වැනි මූලාශ්‍ර වලින් හෙළි වේ.[74] ඇතැම් අවස්ථාවල සුවිශේෂි කාර්යයන් සඳහා ද ඉඩම් පූජා කළ බව මූලාශ්‍රය තුළින් දක්නට ලැබේ. නිදසුනක් ලෙස අභයගිරි විහාරයට ප්‍රතිමා මන්දිරයේ පහන් දැල්වීම සඳහා තෙල් සැපයීම සඳහා ඉඩම් පූජා කිරීම, අවුරුදු පතා භික්ෂූන්ට බත් ලබා දීමට නියම කළ බව ඇත්දත්කඩවල ටැම් ලිපියේ සඳහන් වීම පෙන්වා දිය හැකි වේ.[75]

ඇතැම් අවස්ථාවල ඉඩම් පිළිබඳ අයිතිවාසිකම සෘජුවම විහාරයට ලබා නොදී බදු ආදායම පමණක් ලබා දුන් බව මූලාශ්‍රයන්හි දක්නට ලැබේ.[76] විහාරස්ථානයට ලැබුණු ඉඩම් විහාරයේ කටයුතු සඳහා සේවකයන්ට පවරා දීමේ හැකියාවද භික්ෂූන්ට ලැබී ඇත. මිහින්තලේ පුවරු ලිපියට අනුව දිනකට මැටි බඳුන් 05 බැගින් එම විහාරයට සපයන ලද කුඹල්කරුවන් 08 දෙනෙකුට වගාව සඳහා ඉඩම් කිරිය බැගින් ලබා දී ඇත. මාසයට පාත්‍ර 10ක් හා දිය බඳුන් 10ක් බැගින් සැපයූ තවත් කුඹල්කරුවෙකුට කිරි දෙකක ඉඩමකුත් සහලුත් ලැබී ඇත. විහාරයට හුණු සපයන අයට සුණුබොල් දේවගම නම් ඉඩම ලබා දී තිබීම තුළ මේ බව පැහැදිලි වේ. සිවුරු ධෝවනය කරන අයට කිරි තුනක ඉඩමක් ද ධාන්‍ය ප්‍රවාහනය කළ කරත්තකරුවන්ට හය දෙනෙකුට අමුණුගම නම් ඉඩම පවරා දී ඇත. සේවකයන්ට පමණක් නොව නිලධාරින්ට වේතන ගෙවා ඇත්තේ ඉඩම් ලබා දීම මඟිනි. උත්සව භාරව සිටි මඟුල් ජෙට් නිලධාරියාටද, ආගමික චාරිත්‍ර සංවිධානය කර දින නිවේදනය කළ වත්සික කැමි නිලධාරියාට මෙලෙස ඉඩම් ලබා දුන් බව සඳහන් වේ.[77]

පමණු ඉඩම් සේම විහාර දේපල ඉඩම් ද නැවත පවරා ගත නොහැකි බව මූලාශ්‍රයන්හි දැක්වේ. එමෙන්ම සමන්තපාසාදිකාවේ

දැක්වෙන ආකාරයට රජු හෝ රජ පවුලට අයත් කෙනෙකු විසින් කරන ලද ප්‍රදානයන් වලංගු වන්නේ එම රජ පෙළපතේ අවසානය දක්වා බවත් නැවත එය පාලන බලය හිමි රජු පවරන්නේ නම් පමණක් වලංගු වන බවත් දක්වා ඇත. මෙය සුවිශේෂි තත්ත්වයක් ගන්නා බව දක්නට ලැබේ. V වන කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපියට අනුව විහාර සන්තක ඉඩම් ක්‍රෝධයෙන් යුක්තව පවරා නොගත යුතු බව දක්වා තිබේ.[78] කෙසේ නමුත් ඇතැම් දීමනා අවලංගු කළ බව ද සාධක හමුවේ. II වන උදය (ක්‍රි.ව.887- 898) රජුට අයත් පඬුවස්නුවර ටැම් ලිපියේ අභයගිරි විහාරයේ බෝධි සත්ත්වසරයකට ප්‍රදානය කළ ඉඩම් දෙකක් අවලංගු කළ බවත් දක්නට ලැබේ. ඒ අනුව විහාර දේපල පූර්ණ හිමිකමක් ලැබුවේ ද යන්න ගැටලු සහගත වන බව දක්නට ලැබේ. නමුත් කරන ලද ප්‍රදානයන්ගෙන් බොහෝ ප්‍රමාණයක අයිතිය ඍජුවම පවරා ඇති බව බොහෝ අත්තානි ලේඛනයන්ගෙන් හෙළි වේ. එමෙන්ම අත්තාණි ලිපිවල ''ඉර සහ සඳ'' ලාංඡනය දක්වා තිබීම තුළ ඉර හඳ පවත්නා තෙක් පැවතිය යුතු බවත් බල්ලා සහ කපුටා යන ලක්‍ෂණ තුළින් සංඝයාට පවරන ලද ඉඩම් අයථාකාරයෙන් භුක්ති වින්දනය කරන්නේ නම් හෝ හානි කරන්නේ නම් මතු භවයන්හි බල්ලෙකු හෝ කපුටෙකු වශයෙන් උපත ලබන බව දක්වා තිබීම තුළ ඉඩම් අයිතිවාසිකම් දැක්වීමට ආගමික අර්ථ සහිත පාඨ යොදා ගත් බව පහත නිදසුනෙන් තහවුරු වේ.

''මෙ සම්වතා නොරැකි දේ මහයා ඇපා කෙනෙක් ඇත්නම් කවුඩු බලු වූවා නම්''[79]

එපමණක් නොව වැරි පෙරනාට්ටි, කුඩසලා, යහන්ගොවුවන් ආදි රාජ්‍ය නිලධාරින්ට ඇතුළු වීම තහනම් කිරීම, ගොනුන්, මී ගවයන් ඇතුළු කිරීම තහනම් කිරීම ආදි සුවිශේෂි නීතිරීති මාලාවක් ද ක්‍රියාත්මක වන අයුරු දක්නට ලැබේ. කෙසේ නමුත් රජුට පවා යළි පවරාගත නොහැකි අන්දමේ අයිතිවාසිකම් සහිත ඉඩම් තිබූ බව පෙනී යයි. එමෙන්ම ඇතැම් ඉඩම් සම්බන්ධව ගැටලුවක් පැන නැඟුණහොත් මහා විහාරිය භික්‍ෂූන් වහන්සේලා මැදිහත් වී නිරාකරණය කරන බව රඹෑව ලිපියේ සඳහන් වේ.[80] ඒ අනුව විහාර සන්තක ඉඩම් සම්බන්ධව පූර්ණ අයිතිවාසිකම් සංඝ සංස්ථාව තුළ තිබූ බව දක්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ ක්‍රි.පූ තුන්වන සියවසේ පටන්ම සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර තුළින් ඉඩම් පරිහරණය හා අයිතිවාසිකම පිළිබඳ සාධක හමුවන අතර ඉතා පැහැදිලිවම පෞද්ගලික වශයෙන් නූතන ක්‍රමවේදයන්ට අනුව ඉඩම් අයිතිවාසිකම් ක්‍රමවේදයක් පැවති බව දක්නට ලැබේ. රජු විසින් ප්‍රදානය කරන ලද ඉඩම් පිළිබඳ නැවත රජුට පවරා ගත නොහැකි තරමටම අයිතිය පෞද්ගලිකරණය කිරීමට තරම් නිදහස් ඉඩම් ප්‍රතිපත්තියක් මෙරට ක්‍රියාත්මක වී ඇත. ඉඩම් හිමියන්ට පූර්ණ නිදහස පැවති අතර රාජ්‍යයට හිමි එකම බලතලය වන්නේ බදු එකතු කිරීම පමණි. එයද සුභ සාධනය පදනම් කරගෙන සිදු වූවකි. තවද පමුණු, දිවෙල්, විහාර ගම්බිම් ආදි වශයෙන් අතිශය සංකීර්ණ ඉඩම් ක්‍රමයක් පැවති බවත් කාන්තා පක්ෂයට පවා ඉඩම් හිමිකාරිත්වයක් තිබූ බවත් පැහැදිලි වේ. එබැවින් රජු සතුව පුද්ගලික ඉඩම් පැවතිය ද රජු හෝ රාජ්‍ය අයිතිවාසිකම් වියුක්ත වූ භූමි අයිතිවාසිකම් පැවති බව මෙයින් තහවුරු වේ.

**සමාලෝචනය**

පෙරදිග රජු පිළිබඳව දහනම වන සියවසේ පටන් අර්ථකථනයන් ඉදිරිපත් කිරීමට යුරෝපීය උගතුන් පෙළඹුණු අතර "පෙරදිග රජු ඒකාධිපති පාලකයෙක් ය" යන අදහස ඒ අතර ප්‍රධාන වේ. එහිදි පෙරදිග සමාජය අපරදිගට වඩා පහත් ය යන මතය ඉස්මතු කිරීමට හා තම අධිරාජ්‍යවාදි සංකල්ප ස්ථාවර කිරීමට මෙම මත යොදාගත් ආකාරය පැහැදිලි වේ. එලෙස යොදාගත් තවත් සාවද්‍ය මතයක් වන්නේ පෙරදිග රාජ්‍යයන්හි සියලු ඉඩම් රජු සතු වේ යන්නයි. නමුත් සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක සාධක මනා ලෙස විමර්ශනය කිරීමේ දී එම මතයේ සාවද්‍ය බව වටහා ගත හැකි වේ.

ශ්‍රී ලංකාවේ ද ක්‍රි.පූ තුන්වන සියවසේ පටන්ම සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය තුළින් ඉඩම් පරිහරණය හා අයිතිවාසිකම පිළිබඳ සාධක හමුවන අතර ඉතා පැහැදිලිව ම නූතන ක්‍රමවේදයන්ට අනුව පුද්ගලික ඉඩම් අයිතිවාසිකම් ක්‍රමවේදයක් පැවති බව දක්නට ලැබේ. රජු විසින් ප්‍රදානය කරන ලද ඉඩම් පිළිබඳ නැවත රජුට පවරා ගත නොහැකි තරමටම අයිතිය පෞද්ගලිකරණය කිරීමට තරම් නිදහස් ඉඩම් ප්‍රතිපත්තියක් මෙරට ක්‍රියාත්මක වී ඇත. එමෙන්ම අඳ,

උකස් හා බදු දීම් ආදිය සඳහා ද ඉඩම් හිමියන්ට පූර්ණ නිදහස පැවති අතර රාජ්‍යයට හිමි එකම බලතලය වන්නේ බදු එකතු කිරීම පමණි. එයද සුභ සාධනය පදනම් කරගෙන සිදු වූවකි. තවද පමුණු, දිවෙල්, විහාර ගම්බිම් ආදි වශයෙන් අතිශය සංකීර්ණ ඉඩම් ක්‍රමයක් පැවති බවත්, කාන්තා පක්ෂයට පවා ඉඩම් හිමිකාරිත්වයක් තිබූ බවත් පැහැදිලි වේ. ඒ අනුව පැරණි ශ්‍රී ලංකාවේ පැවති විවිධ ස්වරූපවලින් යුත් ඉඩම් පරිහරණ ක්‍රමවේදයන් පැවති බව මෙයින් තහවුරු වේ.

## ආන්තික සටහන්

1. *දීඝ නිකාය 3*, අග්ගඤ්ඤ සූත්‍රය (දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2001) පිටු 156- 160
2. චන්දන රෝහණ විතානාච්චි, "පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තයේ සමාජ පුරාවිද්‍යාත්මක අවකාශය හඳුනා ගැනීම- ආරම්භයේ සිට ක්‍රිස්තු පූර්ව අවසානය තෙක්," *The Journal of Archeaology and Heritage Studies, VOL. I*, Issue 2 (Mihinthale : Rajarata University of Sri Lanka 2013) & Sudarshan Senavirathna, "The Archaeology of the Megalithic Black and Red were Complex in Sri Lanka", Ancient Ceylon, No.5 (Colombo :Archeology Survey Department, 1984)
3. Inscription of Ceylon Vol. I
4. එච්.ඩබ්. කොඩ්රින්ටන්, *ලංකාවේ පුරාණ ඉඩම් භුක්තිය හා ආදායම* (කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1980) පිටුව 7
5. රොමිලා තාපර්, *ජාතිභේදවාදය හා පුරාණ ඉන්දීය ඉතිහාසය ලිවීම, ජාතිභේද වාදය හා ඉන්දීය ඉතිහාස ලිවීම* (කොළඹ: සමාජ විද්‍යාඥයන්ගේ සංගමය, 1990) පිටුව 05
6. ඉන්ද්‍රකීර්ති සිරවීර, *ශ්‍රී ලංකාවේ කෘෂි ඉතිහාසය*, (කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2005) පිටුව 90
7. ලෙස්ලි ගුණවර්ධන, *සිවුර සහ නගුල* (කොළඹ: සමාජ විද්‍යාඥයන්ගේ සංගමය, 1993) පිටුව 54
8. හිස්සැල්ලේ ධම්මරතන හිමි, *සිංහලයේ ද්‍රවිඩ බලපෑම්* (දිවුලපිටිය: සරස්වතී විද්‍යාලය , 1964) පිටුව 63
9. සිරිවීර, *එම*, පිටුව 90
10. *Inscription of Ceylon Vol. I*, No 1215
11. *I.C. Vol. I*, No 1150

12. *I.C. Vol. I*, No. 1197
13. *ඉතා පැරණි සිංහල බණ කථා* (පරි.) පොල්වත්තේ බුද්ධදත්ත මහා නායක ස්ථවිර (දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2012) පිටුව 106
14. *Epighraphiya Zeylanica. Vol. III*, P. 115-116
15. *E.Z. Vol. III*, P. 191
16. *I.C. Vol. V, No*. 144
17. *I.C. Vol. II, Part I*, No. 62
18. සිරිමල් රණවැල්ල, *පුරාතන ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය*, (නුගේගොඩ: විසිදුනු ප්‍රකාශකයෝ, 2014) පිටුව 60
19. *මහාවංසො*, පළමු වෙළුම (සංස්.) චන්ද්‍රා වික්‍රමගමගේ, (දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2012) පරි. 38 ගාථා. 38
20. *එම*, පරි. 35 ගාථා. 122
21. *I.C. Vol. VI*, No. 4
22. *මහාවංසො*, පළමු වෙළුම (සංස්.) චන්ද්‍රා වික්‍රමගමගේ, (දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2012) පරි. 35 ගාථා. 122
23. *E.Z. Vol. III*, P. 127
24. *I.C. Vol. VII*, No. 10
25. *I.C. Vol.II*, Part I, No. 45
26. රණවැල්ල, *එම*, පිටුව 103
27. *I.C. Vol. V*. Part III, No. 17
28. එන්.ජ්. විමලසේන, *පැරණි ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ බදු ප්‍රතිපත්තින් සහ ඒ සම්බන්ධයෙන් වූ නීතිරීති පද්ධතිය, ඓතිහාසික ලිපි සරණිය* (කර්තෘ ප්‍රකාශන, 2020) පිටුව 311
29. H.W. Condrington, *Anceint Land tenture and Revenue in Ceylon* (Colombo: 1938) P. 53
30. සිරිවීර, *එම*, පිටුව 93
31. *E.Z. Vol. III*, No. 02
32. *මහාවංසො*, දෙවන වෙළුම (සංස්.) චන්ද්‍රා වික්‍රමගමගේ, (දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2012) පරි. 38 ගාථා. 38
33. *E.Z. Vol. I*, No. 04
34. *I.C. Vol. VIII*, No. 18

35. *මහාවංසො*, පළමු වෙළුම පරි. 34 ගාථා. 39
36. *මහාවංසො*, දෙවන වෙළුම පරි. 71 ගාථා. 95
37. *I.C. Vol. VI*, No. 9.2
38. සිරිවීර, *එම*, පිටුව 95
39. *E.Z. Vol. I,* No. 11
40. *I.C. Vol. V*, Part II, No. 44
41. *I.C. Vol. V*, Part II, No. 23
42. *I.C. Vol. VI*, No. 09
43. *I.C. Vol. VI*, No.82
44. *I.C. Vol. VI*, No. 99
45. *I.C. Vol. V*, Part II, No. 01
46. සිරිවීර, *එම*, පිටුව 99
47. *I.C. Vol. V*, Part I, P. 301
48. *I.C. Vol. V*, Part II, P 219
49. *I.C. Vol. VI*, No. 26
50. *I.C. Vol. V*. Part I, No. 63
51. *I.C. Vol. VI*, No. 01
52. *මහාවංසො*, දෙවන වෙළුම පරි. 84 ගාථා. 53-55
53. *I.C. Vol. VI*, No. 90
54. I.C. Vol VII, No 14
55. *I.C. Vol. VIII*, No. 29
56. රණවැල්ල, *එම*, පිටුව. 70
57. *I.C. Vol V*, Part I, No. 114
58. *සද්ධර්මාලංකාරය*, (සංස්,) (දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2017) පි. 587
59. *E.Z. Vol. II*, P. 280
60. රණවැල්ල, *එම*, පිටුව. 72
61. *I.C. Vol. V*. Part. II, No.15

62. *දළදා සිරිත*, (සංස්.) වී ඩී එස් ගුණවර්ධන (මරදාන : සමයවර්ධන පොත් හල, 2008) පිටුව 77
63. *I.C. Vol. V*. Part. II, No.04
64. *I.C. Vol. VI*., No.97
65. *I.C. Vol. VI*., No.94
66. සිරිවීර, *එම*, පිටුව 102
67. *I.C. Vol. VIII*., No.22
68. *Ceylon Tamil Inscription, Part I*, (Ed.) A. Velipillei (Peradeniya, 1971) No. 10
69. සිරිවීර, *එම*, 104
70 රණවීර ගුණවර්ධන ''*සිවුර සහ නගුල*'' (කොළඹ: සමාජ විද්‍යාඥයන්ගේ සංගමය, 1993) පිටුව 61
71. *සහස්සවත්ථුප්පකරණ* (සංස්.) පොල්වත්තේ බුද්ධදත්ත හිමි (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2008) පි. 28
72. සිරිමල් රණවැල්ල, *මායා රට ඉතිහාසය* (විසිදුනු ප්‍රකාශකයෝ: නුගේගොඩ 2016) පි. 56
73. *E.Z., Vol. I*, page 148
74. ගුණවර්ධන, *එම*, 64
75. *I.C. Vol. V*. Part II, No.60
76. ගුණවර්ධන, *එම*, පිටුව 66
77. *I.C. Vol. V*, part III , No.73
78. *I.C. Vol. V,* part III , No.05
79. *I.C. Vol. V*, Part I, No. 100
80. *E.Z. Vol. II*, No. 12